# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1777/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 29/11/2024<br>පැය 1210 |

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජන මාධ්‍ය වෙත යොමු කිරිම.**

**01. නීති විරෝධි මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුර.**

2024.11.28 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ඉංගිරිය පොලිස් වසමේ ගෝන ඉටිවලකඩ ප්‍රදේශයේ වැටලීමක් සිදුකර **නීති විරෝධි මත්පැන් ලීටර් 33 ක්,** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඉංගිරිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන ඇඳුරගලවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.** ඉංගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. නීති විරෝධි දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුර.**

2024.11.28 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැල්ලව පොලිස් වසමේ නිකදළුපොත ප්‍රදේශයේ වැටලීමක් සිදුකර **නීති විරෝධි දුම්වැටි 1000 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන වැල්ලව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක්** වන නිකදළුපොත ප්‍රදේශයේ **පදිංචිකරුවකු වේ.** වැල්ලව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03.** **නීති විරෝධි දුම්වැටි සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුර.**

2024.11.28 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ගොකරැල්ල පොලිස් වසමේ ඉබ්බාගමුව ප්‍රදේශයේ වැටලීම් දෙකක් සිදුකර **නීති විරෝධි දුම්වැටි 400 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට** ගෙන ගොකරැල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 32 හා 58 වයස් වල ඉබ්බාගමුව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** ගොකරැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04.** **කේරළ ගංජා සමඟ සැකකරුවන් 04 ක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මන්නාරම කඳවුර.**

2024.11.28 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මන්නාරම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් තලෛමන්නාරම පොලිස් වසමේ දී වැටලීමක් සිදුකර **කේරළ ගංජා කිලෝ 06 ග්‍රෑම් 120 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් සිව් දෙනෙකු ත්‍රීරෝද රථයක් සමඟ** අත්අඩංගුවට ගෙන තලෛමන්නාරම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 24, 28, 29 හා 32 වයස්වල පසුවන පේසාලේ හා සිරිතෝප්පු ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

තලෛමන්නාරම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05.** **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරන්තලාව කඳවුර.**

2024.11.28 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අරන්තලාව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මහඔය පොලිස් වසමේ හරස්ගල ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මහඔය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන මහඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මහඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**